# #YFORB නිර්මාණ තරඟාවලිය

අයදුම්පත්‍රය - රචනා

01. සම්පූර්ණ නම : ඒ. ඒ. චමිලා මධුවන්ති අධිකාරි

02. වයස් කාණ්ඩය : අවු : 16 - 29 අතර

03. විද්‍යුත් ලිපිනය : Chamiadhikari93@gmail.Com

04. හැඳුනුම්පත් අංකය : 937362935V

05. නිර්මාණ ලබා ගන්නා අවසාන දිනට වයස : අවු : 28 දින 18

06. අයදුම්කරුගේ සහතිකය :

මෙම නිර්මාණය මාගේ නිර්මාණයක් බව සහතික කරමි.

2021.09.09.
දිනය

Chamila
අත්සන

# ආගමක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස උදෙසා සමාවදීම, ඉවසීම හා විශ්වාසය යනාදී මානුෂීය ගුණාංග

ආගමක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස දෙස බැලුවහොත් එය පුළුල් පරාසයකට විහිදී යන මාතෘකාවකි. මානවයා පරිසරය මඟින් නිර්මාණය වූ පරිසරය සමඟ ජීවත්වන සත්වයෙකි. සමාජය බිහිවූ දා පටන් තමන්ට අවබෝධ කරගත නොහැකි වූ, තම විෂය පථයට නොවූ බොහෝ දේ අද්භූත දේවල් හෝ දෙවියන්, යකුන් ලෙස ඒවා සැලකීමට ජනයා පෙළඹුනහ. ඒ මඟින් ජන ආගම්, ජන ඇදහිලි හා ජන විශ්වාසයන් ගොඩනැගුනි. කෙටියෙන් පැවසුවහොත් ජනයා විසින් අදහන ආගම් ලෙස ද ඔවුන්ගේ විවිධ ඇදහිලි ලෙස ද ඒවා සමඟ එක් වූ විවිධ විශ්වාසයන් ජන විශ්වාස ලෙස ද දැක්විය හැකිය.

මුල් කාලයේ මිනිසා විසින් ගෙරවීම, වැස්ස, ඉර, හඳ පමණක් නොව විශාල ගල් පර්වත හා ගස්වැල් පවා දේවත්වයෙන් සලකනු ලැබීය. මේවාට ගරු නොකිරීමෙන් විවිධ ලෙඩ රෝගවලට මුහුණ පෑමටත් තම වගා කටයුතුවලින් සරු අස්වැන්නක් නොලැබීමටත් සිදුවෙතැයි සිතා ඒවා දේවත්වයෙන් පිදීමට ඔවුන්ට සිදුවිය. ලෝකයේ සියලුම ජන කොටස් අඩුවැඩි වශයෙන් මෙකී පිළිගැනීම් සමූහයකට ගුරු වී තිබේ. පසුකාලීනව ඒවා ජන ආගම් බවට පත්විය. නිශ්චිත ශාස්තෘවරයෙක් ඇතිව හෝ නැතිව ජන ආගම් නිර්මාණය වී ව්‍යාප්ත වී ඇති අතර දෙවිවරු, ප්‍රේතයෝ යක්ෂයෝ වැනි විවිධ චරිත ස්වභාවයෙන්

මෙම විශ්වාස හා ඇදහිලි තුළ පවතී ජන ඇදහිලි හා විශ්වාස යනු සම්පූර්ණයෙන්ම යථාර්ථවාදී හෝ විද්‍යාත්මක හෝ කරුණක් නොවනු අතර ඒවා සමාජ විද්‍යාත්මකව යම් ප්‍රබලතාවයක් දක්වයි. "විශ්වාසය" යනු මානුෂීය ඉන්ද්‍රාංගයේ මේ අතර වැදගත් සන්නිවේදනයක් ගන්නා බව මින් පැහැදිලි වේ.

මිනිසා සමාජීය සත්වයෙකු මෙන්ම ආගමික සත්වයෙකු ද වේ. ඔහු සතුව භෞතික ජීවිතයක් තිබෙනවා සේම අධ්‍යාත්මික ජීවිතයක් ද තිබේ. ආගම මිනිසාගේ මූලික අවධානය දිනාගත් සංකල්පයකි. එය මානව ජීවනය හැඩගැස්වීමෙහිලා ප්‍රධාන වේ. එසේම සංස්කෘතික අංගයක් ද වේ.

මිනිසාට ජීව විද්‍යාත්මක, ආර්ථිකය හා සමාජීය අවශ්‍යතාවයන් තිබෙනවා සේම ආගමික අවශ්‍යතාවයන් ද තිබේ. බයිබලයට අනුව මිනිසාට ආහාර පමණක් ප්‍රමාණවත් නොවේ. අධ්‍යාත්මික පසුබිමක් ද අවශ්‍ය වේ.

එඩ්වඩ් ටයිලර් විසින් ආගම නිර්වචනය කර ඇත්තේ "අදහස්, විශ්වාස, ආකල්ප හා අධිස්වාභාවික බලවේගයන්ගේ ක්‍රියාදාමයක් ලෙසයි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වැනි පරිච්ඡේදයේ 10 වැනි ව්‍යවස්ථාවට අනුව සෑම තැනැත්තෙකුටම තමන් කැමති ආගමක් ඇදහීමටත් යම් ලබ්ධියක් හෝ විශ්වාස කර දැරීමේ නිදහසත්, සිතීමේ සහ හෘද සාක්ෂියේ නිදහසත් සඳහා අයිතිය ඇත්තේය යනු අදහස අප වටහාගත යුතුය.

මෙහි සඳහන් වන අයිතිවාසිකම පුරවැසියන්ට ඇති නිදහසකි. මෙම නිදහස අනුව තමාගේ ආගම හෝ ආගමික විශ්වාසයන් ප්‍රකාශයට පත්කිරීමද එම විශ්වාසයන්ට අනුව ආගමික වතාවත්වල යෙදීමට ද එම විශ්වාසයෙන් ආගමික වතාවත්වල යෙදීමට ද එම විශ්වාසයෙන් අන් අයට උගැන්වීමට ද නිදහස ඇත.

ආගමික නිදහස යන අයිතිවාසිකම තුළට කාරණා තුනක් ඇතුළත් වන බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පෙන්වා දී ඇත. එනම් ආගමික විශ්වාසය-ට ඇති නිදහස, ආගමික වතාවත්වල යෙදීමට ඇති නිදහස හා වන්දනීය ස්ථාන කළමනාක-රණය සඳහා ඇති නිදහසයි.

මීළඟට අප විමසා බැලිය යුත්තේ මිනිසා ආගමක් අදහිය යුත්තේ කෙසේද යන්නයි. තමාගේ එලොව මෙලොව ජීවිතය සාර්ථක කරගැනීමට ආගම ඇදහිය යුතු බව බුද්ධධර්මයේ සඳහන් වේ. අනෙක් ආගම්වලද මිනිස් ජීවිතය සාර්ථක කරගැනී-මට ආගම ඇදහිය යුතු බව අවධාරණය කරගත යුතුය. මේ අනුව ආගමක වැදගත්-කම රඳා පවතින්නේ එහි දර්ශනය මත බව පිළිගත් සත්‍යයකි. ඒ කෙරේ සැලකිල්ලක් නොවී. චාරිත්‍ර වාරිත්‍ර හා වත්පිළිවෙත් කෙරේ පමණක් යොමු වීමෙන් ආගමකින් ලැබිය යුතු සුබ සාධනය ඇති නොවේ. ආගම මානව වර්ගයාගේ හිතසුව පිණිස යොදා-ගැනීම ඉතා වැදගත්ය.

විවිධ ආගම් අදහන අය අතර පවතින සුහදතාවය හා සහයෝගීතාවය ඇති වන්නේ ආගමික දර්ශනය තේරුම්

ගැනීමෙනි. සමාජයෙහි සදාචාර ආචාරධර්ම දියුණු කොට යහපත් පුද්ගලයන් බිහිකිරීම ආගමකින් ඉටුවිය යුතු මහඟු කාර්යයකි. තවද මුලු මහත් සමාජයට එකම පවුලක් ලෙසින් ජීවත්වීමට අවශ්‍ය පසුබිම සකස් කළ හැක්කේ ආගමෙහි ප්‍රධාන අංගය වන දර්ශනය තුළිනි.

ලොව බොහෝ රටවල ජාති භේද ආගම් භේද මුවාවෙන් බලය ලබා ගැනීමටත් බලය තහවුරු කරගැනීමටත් ප්‍රයත්න දරන්නේ රහසිගතව ආගමික සමගිය නැති කරති.

බෞද්ධාගමේ ඉගැන්වෙන දයාව, කරුණාව, මෛත්‍රිය, ඉවසීම, වැඩිහිටියන්ට ගරුකිරීම, ආදී උතුම් ගුණාංග ලොව සියලු දෙනා කෙරෙහිම දැක්විය යුතු බව බුදු දහමේ ඉගැන්වේ. මේසා උදාහරණ කොට බුද්ධ චරිතයේ එන අංගුලිමාල කතා වස්තුව, සාම ජාතකය, නාලාගිරි දමනය ආදිය දැක්විය හැකිය.

එමෙන්ම හින්දු ආගමේ පරමාර්ථය වී ඇත්තේ සෑම දෙනාටම යහපත සැලසීමයි. හින්දු භක්තිකයන් තුළ ද ඉවසීම, විශ්වාසය සමාව දීම යන මානුෂීය ගුණාංග ඔවුන්ගේ රාමායණය, අර්ථ ශාස්ත්‍රය, වැනි ග්‍රන්ථවලින් ඉස්මතු වේ. දෙවිවරුන් ඇදහීමේ සංකල්පය තුළින් යහපත් පුරවැසියන් සමාජයට දායාද වන බව පැහැදිලි වන කරුණකි. ක්‍රිස්තු ධර්මයේ ඉගැන්වෙන සියල්ලටම ප්‍රේම කිරීමත්, ඉස්ලාම් ධර්මයේ ඉගැන්වෙන සහෝදරත්වයත් ඉතා වටිනා ආගමික පරමාර්ථ වේ. මේ නිසා ආගම්වල දර්ශනය මිනිස් යහපත උදෙසාම බව ඉතා පැහැදිලිය.

එබැවින් මිනිසුන් ආගම කෙරෙහි යොමු විය යුත්තේ සත්‍ය ප්‍රකෘතිය සඳහා බව සියලු ආගමික නායකවරුන්ගේ දර්ශනය වී ඇත. ධම්මපදය, භගවත් ගීතාව, බයිබලය, අල්කුරානය වැනි ප්‍රධාන ආගමික ග්‍රන්ථ මේසා උදාහරණ කොට දැක්විය හැකිය. ආගමික චාරිත්‍ර වාරිත්‍ර හා වත් පිළිවෙත් තුළම පමණක් නැඹුරු වීම රටේ ඉදිරි ගමනට හිතකර නොවේ. එබැවින් ආගම මිනිස් වර්ගයාගේ හිත සුව පිණිස යොදා ගැනීමට නම් ඒ ඒ ආගම්වල ඇති දර්ශනය මනාවින් තේරුම් ගෙන ක්‍රියා කළ යුතු බව ඉතා පැහැදිලිය.

මේ අනුව සමස්තයක් ලෙස අපට නිගමනය කළ හැක්කේ ආගමක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස උදෙසා සමාව දීම, ඉවසීම, හා විශ්වාසය යන මානුෂීය ගුණාංග වර්තමානයට පමණක් නොව අනාගතය උදෙසා යහපත් පුරවැසියන් දායාද කරලීමට ඉවහල් වන බව යළි යළිත් පසක් කරගත යුතුය.

RATHNA